# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 29 දරන මාධ්‍යවේදීන් සඳහා වන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත

---

[සහතිකය සටහන් කළේ **2006** සැප්තැම්බර් මස **05** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 සැප්තැම්බර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 10.75 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

## 2006 අංක 29 දරන මාධ්‍යවේදීන් සඳහා වන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත

[සහතිකය සටහන් කළේ 2006 සැප්තැම්බර් මස 05 වන දින]

එල්. ඩී.—ඕ. 61/2005.

මාධ්‍යවේදීන් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම පිණිස ද ; සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. (1) මේ පනත 2006 අංක 29 දරන මාධ්‍යවේදීන් සඳහා වන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන මෙම පනත පාර්ලිමේන්තු පනතක් ලෙස සහතික කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු අතර, අනෙකුත් විධිවිධාන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්, නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස

### මාධ්‍යවේදීන් සඳහා ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් පිහිටුවීම

**2**. මේ පනතේ විධිවිධානවලට අනුව (මෙහි මින් මතු "ප්‍රතිලාභ යෝජනා ක්‍රමය" යනුවෙන් හඳුන්වනු ලබන) මාධ්‍යවේදීන් සඳහා වන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලබන, යෝජනා ක්‍රමයක් පිහිටුවනු ලැබිය යුතු ය.

මාධ්‍යවේදීන් සඳහා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිහිටුවීම.

**3**. ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ මාධ්‍ය ආයතනවල සේවයේ නියුක්ත මාධ්‍යවේදීන්ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ආකාරයට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම වේ.

ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අරමුණ.

ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳීම සඳහා වන සුදුසුකම්.

4. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, —

(අ) මාධ්‍ය ආයතනයක සේවයේ නියුක්ත මාධ්‍යවේදියකු වන ; සහ

(i) එම ආයතනයෙහි එම සේවා නියුක්තියෙහි සේවය ස්ථිර කරනු ලැබූ මාධ්‍යවේදියකු ; හෝ

(ii) එම ආයතනයෙහි කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි නියුක්තව සිටින මාධ්‍යවේදියකු ; හෝ

(iii) එම ආයතනයෙහි සේවයෙහි නියුක්ත නිදහස් මාධ්‍යවේදියකු හෝ,

වන ;

(ආ) වයස අවුරුදු දහඅටට නොඅඩු සහ අවුරුදු පනහට නොවැඩි වන ; සහ

(ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදලට, අවස්ථාවෝචිත පරිදි, දායක වන හෝ නොවන,

යම් තැනැත්තකුට ස්වේච්ඡා පදනමක් මත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම තිබිය යුතු ය :

එසේ වුවද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී වයස අවුරුදු පනහට නොඅඩු සහ අවුරුදු පනස් පහට නොවැඩි යම් මාධ්‍යවේදියකු මේ වගන්තියේ (ආ) ඡේදයේ අවශ්‍යතා සපුරා නැති වුව ද එය නොතකා ඔහුට ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳීමේ හිමිකම ඇත :

එසේම, තවදුරටත්, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක සාමාජිකයකු වන හෝ ඒ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවන යම් මාධ්‍යවේදියකුට මේ පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳීමට හිමිකම නොතිබිය යුතු ය.

ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ.

5. (1) (මෙහි මින් මතු "දායකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳෙන්නා වූ යම් මාධ්‍යවේදියකුට, නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට ගණනය කරනු ලබන මුදල් ප්‍රමාණයක නියතකාලීන ප්‍රතිලාභ ලැබීමට හිමිකම තිබිය යුතු ය.

(2) ගෙවිය යුතු ප්‍රතිලාභ ප්‍රමාණය ගණනය කිරීමේ පදනම නියම කිරීමේ දී, දායක මුදල් ගෙවනු ලැබූ කාලසීමාව, දායකයාගේ වයස සහ දායකයා විසින් ගෙවන ලද සම්පූර්ණ මුදල සැලකිල්ලට ගත යුතු ය.

ප්‍රතිලාභ ගෙවිය යුත්තේ කවර විටකදී ද යන වග.

**6**. (1) දායකයකු වයස අවුරුදු හැටට එළඹුන විට 5 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට ගණනය කරනු ලබන පරිදි, ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ නියමිත ප්‍රතිලාභ ප්‍රමාණය, මාසික වාරිකවලින් ලබා ගැනීමට එම දායකයාට හිමිකම ඇති අතර, එම දායකයා මිය යන මාසයේ අවසානය දක්වා ම මාසික ප්‍රතිලාභ අඛණ්ඩව ලැබිය යුතු ය.

(2) ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ මාසික ප්‍රතිලාභ ලැබීම ආරම්භ වී ඇති දායකයකු ඔහු වයස අවුරුදු අසූව එළඹීමට පෙර මියගිය විටක දී—

(අ) ජීවත්ව සිටින කලත්‍රයා සිටින අවස්ථාවක—

(i) එම කලත්‍රයා වෙනත් යම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක හෝ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක අර්ථලාභියකු හෝ දායකයකු නොවන්නේ නම්, මියගිය දායකයා ජීවත්ව සිටිමින්, ඔහු විසින් වයස අවුරුදු අසූව එළඹෙන තුරු මාසික ප්‍රතිලාභ ලැබිය හැකිව තිබූ ආකාරයට ම, මාසික ප්‍රතිලාභ ලැබීමට එම කලත්‍රයාට ද හිමිකම තිබිය යුතු ය ; නැතහොත්

(ii) එම කලත්‍රයා වෙනත් යම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක හෝ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක අර්ථලාභියකු හෝ දායකයකු වන්නේ නම්, මියගිය දායකයා විසින් ගෙවන ලද සම්පූර්ණ දායක මුදලින් නොගෙවා ඉතිරිව ඇති මුදල වශයෙන් ඇති දායක මුදල් ප්‍රමාණය, අදාළ අවස්ථාවේ දී පවත්නා බැංකු පොළී අනුපාත සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පොළිය සමග ලබා ගැනීමට කලත්‍රයාට හිමිකම තිබිය යුතු ය.

(ආ) ජීවත්ව සිටින කලත්‍රයකු නොමැති අවස්ථාවක—

(i) අවුරුදු විසි එකට අඩු දරුවකු සිටී නම් ඒ දරුවා ; හෝ

(ii) අවුරුදු විසි එකට අඩු දරුවන් එක් අයකුට වඩා සිටී නම් ඒ එක් එක් දරුවා සමානුපාතිකව,

ඉහත (2) (අ) (i) වගන්තිය යටතේ කලත්‍රයාට ගෙවිය යුතු මාසික ප්‍රතිලාභ ලැබීමට හිමිකම ලැබිය යුතු ය.

(3) කලත්‍රයා මිය ගියහොත් හෝ නැවත විවාහ වුවහොත්, ඉහත (2) (අ) (i) උපවගන්තිය යටතේ එකී කලත්‍රයාට ගෙවිය යුතු මාසික ප්‍රතිලාභ ගෙවීම අවසන් විය යුතු අතර, එකී කලත්‍රයා මියයාමට හෝ නැවත විවාහවීමට පෙර ඒ කාලත්‍රයාට ගෙවනු ලැබිය යුතු වූ මාසික ප්‍රතිලාභ ලැබීමට මියගිය දායකයාගේ අවුරුදු විසි එකට අඩු, අවස්ථාවෝචිත පරිදි දරුවා හෝ දරුවන්ට හිමිකම ඇත්තේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, දායකයාගේ දරුවා හෝ දරුවන්ට ගෙවිය යුතු මාසික ප්‍රතිලාභ ගෙවීම, ඔවුන් විවාහ වීම හෝ අවුරුදු විසි එකට එළඹීම හෝ යන දෙකින් වඩා කලින් සිදුවන සිද්ධියේ දී අවසන් වන්නේ ය :

එසේ වුවද, දරුවා හෝ දරුවන් සදාකාලිකව ආබාධිත වී ඇති බවට යථා පරිදි ස්ථාපිත වෛද්‍ය මණ්ඩලයක් විසින් සහතික කොට ඇති විටක, අවස්ථාවෝචිත පරිදි, එකී දරුවාට හෝ දරුවන්ට ගෙවිය යුතු මාසික ප්‍රතිලාභ එකී දරුවා හෝ දරුවන් මියගිය පසු පමණක් අවසන් වන්නේ ය.

(5) මාසික ප්‍රතිලාභ ලැබීම ආරම්භ කළ දායකයකු අවුරුදු අසූව එළඹීමට පෙර, ජීවත්ව සිටින කලත්‍රයකු හෝ අවුරුදු විසි එකට අඩු දරුවන් හෝ නොමැතිව මියගිය අවස්ථාවක, ඒ දායකයා විසින් ගෙවන ලද මුළු දායක මුදලින් නොගෙවා ඉතිරිව ඇති දායක මුදල් ප්‍රමාණය අදාළ කාලයේ දී පවතින බැංකු පොළී අනුපාතයන් සැලකිල්ලට ගනිමින් ඒ මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක පොලිය ද සමග ඔහුගේ සමීපතම ලේ ඥාතීන්හට මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන්ව ඇති පරිදි වූ අනුපාතයට සහ ප්‍රමුඛතාවයේ අනුපිළිවෙලට ගෙවිය යුතු ය.

(6) ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීම ආරම්භ වීමට පෙර යම් දායකයකු මියගිය අවස්ථාවක, ඔහු මියයන දින තෙක් ගෙවා තිබූ මුළු දායක මුදල් ප්‍රමාණය ඔහුගේ සමීපතම ලේ ඥාතීන්හට, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන්ව ඇති පරිදි වූ අනුපාතයට සහ ප්‍රමුඛතාවයේ අනුපිළිවෙලට ගෙවිය යුතු ය.

දායක මුදල් මත ප්‍රතිදානය.

7. ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට බැඳීම සඳහා මාධ්‍යවේදීන් දිරිමත් කිරීමේ අරමුණින් අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, දායකයා විසින් ගෙවන ලද දායක මුදල් මත, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතිදානයක් හෝ වට්ටමක් වශයෙන් ලබා දිය හැකි ප්‍රතිශතය නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

## ප්‍රතිලාභ යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම

සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම කළ යුතු බව.

**8**. 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම සඳහා වග කියනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**9**. (1) මේ පනත මගින් මණ්ඩලය වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා මණ්ඩලයට පහත සඳහන් බලතල ඇත :—

(අ) ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ;

(ආ) ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් නියමිත ආයුගණක, මූල්‍ය සහ මෙහෙයුම් වාර්තා පවත්වාගෙන යාම ;

(ඇ) මණ්ඩලයේ මතය අනුව ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ කර්තව්‍ය නිසි පරිදි ඉටු කිරීම සඳහා හෝ එම ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා ඉටු කිරීම.

(2) ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක වන තැනැත්තන් බඳවා ගැනීමට සහ මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් කාරණයකට අදාළව, 1987 අංක 46 දරන ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමයේ නිර්දේශ සහ නිරීක්ෂණ ලබාගැනීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

මණ්ඩලය විසින් එක් එක් දායකයාට ඔප්පු නිකුත් කළ යුතු බව.

**10**. යම් තැනැත්තකු ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායකයකු වශයෙන් බඳවා ගැනීමේ දී, මණ්ඩලය විසින් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ඔප්පුවක් ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඔහු වෙත නිකුත් කරන ලද ඔප්පුව ප්‍රකාරව ඔහු විසින් ගෙවිය යුතු දායක මුදල්, එම ඔප්පුවේ අන්තර්ගත නියම සහ කොන්දේසි සහ එම ඔප්පුව ප්‍රකාරව ඔහුට හිමි ප්‍රතිලාභ එම ඔප්පුවේ සඳහන් කළ යුතු ය.

ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ ඔප්පුව අහිමිකරණය කිරීම.

**11.** (1) දායකයකු විසින් දායක මුදල් ගෙවිය යුතු වන්නේ යම් දිනකට පෙර ද, එම දිනය ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඔප්පුවේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර, එම දිනයේ දී හෝ එදිනට පෙර අඛණ්ඩ වාරික දහයක් ගෙවීම පැහැර හරින යම් දායකයකුට නිකුත් කරන ලද ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඔප්පුව යටතේ ඔහුට හිමි ප්‍රතිලාභ ඔහුට අහිමි විය යුතු ය.

(2) තමා වෙත නිකුත් කරන ලද ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඔප්පුවක් යටතේ ප්‍රතිලාභ, යම් දායකයකුට අහිමි වී ඇති අවස්ථාවක මණ්ඩලය විසින් ඒ බව සඳහන් කරමින් ඒ දායකයා වෙත දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(3) තමාගේ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඔප්පුව වලංගුකරවා ගැනීම සඳහා මණ්ඩලය වෙත අභියාචනය කිරීමට දායකයකුට අයිතියක් ඇති අතර, වාරික මුදල් ගෙවීම පැහැර හැරීම දායකයාට පාලනය කළ නොහැකි හේතු නිසා සිදු වූ බවට මණ්ඩලය සෑහීමට පත් වන්නේ නම්, මණ්ඩලය විසින් එම ඔප්පුව වලංගු කළ යුතු ය.

(4) මණ්ඩලය විසින්, ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඔප්පුව ඉදිරිපත් කරන ලද අභියාචනයක් මත, වලංගු කිරීමට තීරණය කරන අවස්ථාවක, වාරික මුදල්වල හිඟ මුදල ගෙවිය යුත්තේ යම් දිනයකට පෙර ද, එම දිනය පිළිබඳව දායකයාට දැනුම් දිය යුතු ය. එම දායක මුදල් ගෙවනු ලබන දිනය එම ඔප්පුව වලංගු වන දිනය ම විය යුතු ය.

(5) මණ්ඩලයේ තීරණයකින් අතෘප්තියට පත්වන යම් දායකයකු විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර, ඒ පිළිබඳ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු ය.

ප්‍රතිලාභ පැවරීම හෝ මාරු කිරීම කළ නොහැකි බව.

**12.** ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු කිසිම ප්‍රතිලාභයක් පැවරීම හෝ මාරුකිරීම නොකළ යුතු අතර, එවැනි පැවරීමක් හෝ මාරු කිරීමක් සම්පූර්ණයෙන්ම බල රහිත විය යුතු ය. එම ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ යම් තැනැත්තකුට ද, එම තැනැත්තාගෙන් අයවිය යුතු යම් ණයක් හෝ ගෙවීමක් සම්බන්ධයෙන් එම ප්‍රතිලාභ අත්පත් කර ගැනීම හෝ එම ණය හෝ ගෙවීම සඳහා ලබාගැනීම හෝ නොකළ යුතු ය.

## III වන කොටස

## මාධ්‍යවේදීන් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවීම

මාධ්‍යවේදීන් සඳහා වන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදල.

**13**. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) මාධ්‍යවේදීන් සඳහා වූ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අරමුදලේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් මිලියන සියයක් විය යුතු අතර, එය ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදල කළමනාකරණය කිරීමේ, පාලනය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය මණ්ඩලය සතු වේ.

(4) පහත සඳහන් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :—

(අ) ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් ;

(ආ) දායකයන් විසින් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවනු ලබන සියලු මුදල් ;

(ඇ) මණ්ඩලයේ ආයෝජන මගින් පොළිය හෝ ලාභ වශයෙන් උපයන සියලු මුදල් ;

(ඈ) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී පරිත්‍යාග වශයෙන් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඉ) කවර හෝ ප්‍රභවයකින් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට ලැබෙන සියලු මුදල් ;

(ඊ) යම් රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ රාජ්‍ය සංස්ථාවකින් අරමුදල සතු කරනු ලබන සියලු මුදල්.

(5) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් ආයෝජනය කිරීම.

**14**. මණ්ඩලයට වහාම අවශ්‍ය නොවන අරමුදලේ සියලු මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් බලය පවරනු ලබන ආකාරයට සහ එවැනි සුරැකුම්වල ආයෝජනය කරනු ලැබිය හැකි ය.

ණයට ගැනීමේ බලතල.

**15**. (1) මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ එවැනි ම එකඟත්වයක් ඇතිව දෙන ලද යම් පොදු අධිකාරයක නියමයන්ට අනුකූලව මණ්ඩලයේ බැඳීම් ඉටු කිරීම සඳහා සහ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍යය විය හැකි මුදල් අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ කොන්දේසි සාකච්ඡා කර ණය ආකාරයෙන් හෝ ලබා ගැනීම කළ හැකි ය :

එසේ වුවද මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ණය වශයෙන් ගනු ලැබූ යම් මුදල් සම්බන්ධයෙන් ආපසු ගෙවීමට ඇති මුදල්වල එකතුව කිසිම අවස්ථාවක දී මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණ නොඉක්මවිය යුතු ය.

(2) මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව පහත දැක්වෙන සියලුම කාර්යය සඳහා හෝ ඉන් යම් කාර්යයක් සඳහා හෝ (1) වන උපවගන්තිය යටතේ ණය මුදල් වශයෙන් ලබා ගැනීම හැර අන්‍යාකාරයකින් මුදල් ණයට ලබා ගත හැකි ය :—

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වන නිශ්චල හෝ චංචල දේපළ අධිග්‍රහණය කිරීම හෝ අත්කර ගැනීම ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ගනු ලැබූ යම් මුදල් ආපසු ගෙවීම.

මණ්ඩලයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය.

**16**. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මණ්ඩලය විසින් මණ්ඩලයේ ආදායම, වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

17. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (ආ) (V) වන වගන්තියේ කාර්ය සඳහා අරමුදල, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් පිහිටුවනු ලැබූ අරමුදලක් විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අදාළ කිරීම.

18. 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන මණ්ඩලයට අදාළ විය යුතු බව සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

1971 අංක 38 දරන පනත අදාළ වීම.

IV වන කොටස

**සාමාන්‍ය**

19. (1) අමාත්‍යවරයා විසින් –

නියෝග.

(අ) ප්‍රතිලාභ යෝජනා ක්‍රමය විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ආ) දායකයන් විසින් ගෙවිය යුතු දායක මුදල් ගෙවීම පැහැර හැරීම, ඔප්පුව පවාරණය කිරීම සහ දායකයකු වීමට ඇති යෝග්‍යතාව නැතිවීම පාලනය කෙරෙන කොන්දේසි ;

(ඇ) මණ්ඩලය විසින් එහි වැඩකටයුතුවල යෙදීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ; සහ

(ඈ) ඔප්පුව අවලංගු කිරීම හෝ අහිමිකරණය කිරීම,

ඇතුළුව මේ පනතින් නියම කළ යුතු යයි දක්වා ඇති හෝ නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම හැකි පහසු ඉක්මනින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කිරීමේ දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලබන යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ඒ නියෝග ගැසට් පත්‍රයේ පළකිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින්,

පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම ඒ අනනුමතයේ දින සිට, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් ආරක්ෂාව.

**20**. (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ එසේ කරන ලද ලෙස පෙනෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ හෝ, මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ විසින් සද්භාවයෙන් කරන ලද හෝ එසේ කරන ලද ලෙස පෙනෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව,

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගත්තා ලද යම් නඩු ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද හෝ එසේ කරන ලද ලෙස පෙනෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් ඒ වියදම ඒ තැනැත්තා විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවහොත් මිස, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**21**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**22**. මේ පනතේ කාර්යය සඳහා, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස—

අර්ථ නිරූපණය.

"මාධ්‍යවේදියා" යන්නෙන්, මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ඇතුළුව යම් සන්නිවේදන මාධ්‍යයක් හරහා ප්‍රවෘත්ති සහ තොරතුරු ද, එම ප්‍රවෘත්ති සහ තොරතුරු පිළිබඳ විස්තර ද, එකතු කිරීමේ, සකස් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ නියැලී සිටින ජනමාධ්‍යවේදියකු වන්නා වූ තැනැත්තකු අදහස් වේ.

## I වන උපලේඛනය

[6 (5) වන වගන්තිය]

ජීවත්ව සිටින කලත්‍රයකු හෝ අවුරුදු විසි එකට අඩු සුජාත දරුවන් හෝ නොමැති අවස්ථාවක, දායක මුදලේ නොගෙවා ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය ගෙවිය යුතු වන කොටස් අනුපාතය වනුයේ—

(අ) අවුරුදු විසි එකට වැඩි ජීවත්ව සිටින සුජාත දරුවන් අතර සමානුපාතිකව බෙදනු ලැබිය යුතු ය ;

(ආ) අවුරුදු විසි එකට වැඩි ජීවත්ව සිටින සුජාත දරුවන් කිසිවකු නොමැති විට –

(i) ජීවත්ව සිටින දෙමව්පියන් එක් අයකුට වැඩියෙන් සිටී නම්, ඒ දෙමව්පියන් අතර, සමානුපාතිකව බෙදනු ලැබිය යුතු ය ;

(ii) දෙමව්පියන්ගෙන් එක් අයකු පමණක් ජීවත්ව සිටීනම්, මුලු මුදල ම එම මවට හෝ පියාට ගෙවනු ලැබිය යුතු ය ;

(iii) දෙමව්පියන් නොමැති අවස්ථාවක දී, ජීවත්ව සිටින සහෝදරයන් සහ සහෝදරියන් එක් අයකුට වැඩියෙන් සිටී නම්, ඒ ජීවත්ව සිටින සහෝදරයන් සහ සහෝදරියන් අතර, සමානුපාතිකව බෙදනු ලැබිය යුතු ය ;

(iv) ජීවත්ව සිටින එක සහෝදරයකු හෝ එක සහෝදරියක පමණක් සිටී නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ සහෝදරයාට හෝ සහෝදරියට මුළු මුදල ම ගෙවනු ලැබිය යුතු ය.

II වන උපලේඛනය

[6 (6) වන වගන්තිය]

දායකයා විසින් ගෙවන ලද සම්පූර්ණ දායක මුදල් ප්‍රමාණය 6 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු කොටස් අනුපාතය සහ ගෙවීම පිළිබඳ ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල වනුයේ –

(අ) ජීවත්ව සිටින කලත්‍රයකු හා සුජාත දරුවන් සිටින විටක –

(i) සියයට පනහක් ජීවත්ව සිටින කලත්‍රයාට ; සහ

(ii) ඉතිරි සියයට පනහ දායකයාගේ ජීවත්ව සිටින සුජාත දරුවන් අතර සමානුපාතිකව බෙදිය යුතු ය ;

(ආ) ජීවත්ව සිටින කලත්‍රයකු නොමැති නම් මිය ගිය තැනැත්තාගේ ජීවත්ව සිටින සුජාත දරුවන් අතර සමානුපාතිකව එම සම්පූර්ණ මුදල බෙදනු ලැබිය යුතු ය ;

(ඇ) ජීවත්ව සිටින කලත්‍රයකු හෝ සුජාත දරුවන් නොමැති නම් –

(i) ජීවත්ව සිටින දෙමව්පියන් එක් අයෙකුට වැඩියෙන් සිටී නම්, එම මුදල ජීවත්ව සිටින දෙමව්පියන් අතර සමානුපාතිකව බෙදනු ලැබිය යුතු ය ;

(ii) ජීවත්ව සිටින්නේ දෙමව්පියන්ගෙන් එක් අයකු නම්, සම්පූර්ණ මුදල එම තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය ;

(iii) ජීවත්ව සිටින දෙමව්පියන් දෙදෙනා ම නොමැති නම් සහ ජීවත්ව සිටින සහෝදර සහෝදරියන් එක් අයකුට වැඩියෙන් සිටින්නේ නම්, එම ජීවත්ව සිටින සහෝදර සහෝදරියන් අතර සමානුපාතිකව බෙදනු ලැබිය යුතු ය ;

(iv) ජීවත්ව සිටින එක් සහෝදරයෙක් හෝ සහෝදරියක් පමණක් සිටී නම් එම සම්පූර්ණ මුදල එම සහෝදරයාට හෝ සහෝදරියට ගෙවනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.